# ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව
## காணி ஆணையாளர் நாயகத்தின் திணைக்களம்
## LAND COMMISSIONER GENERAL'S DEPARTMENT

"මිහිකත මැදුර", ඉඩම් මහලේකම් කාර්යාලය, 1200/6, රජමල්වත්ත පාර, බත්තරමුල්ල.
"மிஹிகதமெதுர", காணிச் செயலகம், 1200/6, ராஜமல்வத்த வீதி, பத்தரமுல்ல
"Mihikatha Medura", Land Secretariat, 1200/6, Rajamalwatta Road, Battaramulla.


| | | | |
|---|---|---|---|
| මගේ අංකය / எனது இல / MY NO | 4/1/චක්‍රලේඛ | ඔබේ අංකය / உமது இல / YOUR NO | |
| දිනය / திகதி / DATE | 2015.12.30 | | |

චක්‍රලේඛ අංකය:- 2015/09

සියලුම ප්‍රාදේශීය ලේකම්වරුන්,
නියෝජ්‍ය /සහකාර ඉඩම් කොමසාරිස්වරුන් (අන්තර් පළාත්).

**<u>රජයේ ඉඩම් ආඥා පනත යටතේ නේවාසික කටයුතු සඳහා ඉඩම් ලබා දීමේ දී</u>**

**<u>එකවර දීමනා පත්‍ර ලබා දීම.</u>**

නේවාසික කටයුතු සඳහා රජයේ ඉඩම් ආඥා පනත යටතේ ලබාදුන් ඉඩම් නිසි පරිදි සංවර්ධනය කර භුක්ති විඳි නම් තක්සේරු මුදල අය කර ගැනීමෙන් පසුව නිදහස් දීමනා පත්‍ර ලබා දීම වර්තමාන ප්‍රතිපත්තිය වේ. මෙතෙක් මේ සම්බන්ධයෙන් පැවති ක්‍රමවේදය වන්නේ ඉල්ලුම්කරු වෙත පළමුව දීර්ඝ කාලීන බදුකරයක් නිකුත් කර අනතුරුව දීමනා පත්‍ර ලබා දීම වේ. එහෙත් මෙම ක්‍රමවේදය භාවිතා කරමින් නේවාසික කටයුතු සඳහා ඉඩම් ලබා දීමේ දී දීර්ඝ කාලයක් ගතවීම හේතුවෙන් සේවාලාභීන් දුෂ්කරතාවයට පත්වනවා මෙන්ම එක් කාර්යයක් සඳහා සංකීර්ණ ක්‍රියා පටිපාටි දෙකක් අනුගමනය කිරීම පරිපාලනමය වශයෙන් ද බාධාකාරී තත්ත්වයක් බවට හඳුනාගෙන ඇත.

ඉඩම් ලබා දීමේ දී ඇති වන දුෂ්කරතාවයන් අවම කර ගැනීමේ අරමුණින් ඉදිරියේදී රජයේ ඉඩම් ආඥා පනත යටතේ නේවාසික කටයුතු සඳහා ඉඩම් ලබා දීමේ දී පහත සඳහන් ප්‍රතිපත්තිමය තීරණයන් ක්‍රියාත්මක කිරීම සඳහා ඉඩම් අමාත්‍යාංශයේ ලේකම්ගේ අංක 4-1/28(IV) වෙළුම හා 2015.12.10 දිනැති ලිපිය මගින් අනුමැතිය ලබා දී ඇත.

ඒ අනුව රජයේ ඉඩම් ආඥා පනතේ විධිවිධාන අනුව පහත දැක්වෙන කණ්ඩායම් වලට අදාළව නේවාසික කටයුතු සඳහා ඉඩමක් ලබා ගැනීමට සුදුසුකම් ලැබූ පුද්ගලයෙකුට අදාල ඉඩම සංවර්ධනය කර ස්ථිර ලෙස පදිංචිව සිටින්නේ නම් හා එම ඉඩමේ සම්පූර්ණ තක්සේරු වටිනාකම හා වාර මුදල ගෙවීමෙන් පසුව එකවර දීමනා පත්‍ර ලබා ගත හැකිය.

i. මෙතෙක් දීර්ඝ කාලීන බදු අනුමැතියක් ලබා දී නොමැති නමුත් තෝරා ගැනීමේ දින සිට වසර 10 ක කාලයක් ගත වී ඇති පුද්ගලයන්ට.
ii. දීර්ඝ කාලීන බදු අනුමැතියක් ලබා දී ඇති හා බද්ද ක්‍රියාත්මක වන දින සිට වසර 10 ක් ගත වූ පුද්ගලයන්ට.
iii. දීර්ඝ කාලීන බදුකරයක් නිකුත් කර ඇති, බද්ද ක්‍රියාත්මක වන දින සිට වසර 05 ක් ගත වී ඇති පුද්ගලයන්ට.

මෙලෙස එකවර දීමනා පත්‍ර ලබා ගැනීමට අපේක්ෂා කරන පුද්ගලයන්ට දීමනා පත්‍ර නිකුත් කරනුයේ ඉඩමේ තක්සේරු මුදල ගෙවා අවසන් කළ පසුවය. තවද දැනට ඉහත පරිදි දීමනා පත්‍රයක් ලබා ගැනීමට සුදුසුකම් තිබුණේ


දුරකථනය ... 011 ... ෆැක්ස් ... 011 ... වෙබ් ලිපිනය ... ඊමේල් ...

පුවද එසේ ලබා ගැනීමට අපේක්ෂා නොකරන පුද්ගලයන්ට දීර්ඝ කාලීන බදුකරයක් ලබා ගත හැකි අතර බදු අපේක්ෂා කරන මතු දිනයක දී ඉහත පරිදි දීමනා පත්‍රයක් ඉල්ලුම් කළ හැකිය.

මේ අනුව රජයේ ඉඩම් ආඥා පනත යටතේ නේවාසික කටයුතු සඳහා ඉඩම් ලබා දීමේ දී ඉහත සඳහන් කාණ්ඩ වලට අදාළ වන පුද්ගලයින් වෙත එකවර දීමනා පත්‍ර ලබා දීම සඳහා ජනතාව දැනුවත් කර සුදුසුකම් ලබන පුද්ගලයින්ගේ ඉල්ලීම් ලබා ගෙන ඉදිරි කටයුතු කිරීමට ඔබ විසින් පියවර ගත යුතුයි.

ආර්.පී.ආර්. රාජපක්ෂ,
ඉඩම් කොමසාරිස් ජනරාල්.

පිටපත්:
1. ලේකම් - ඉඩම් අමාත්‍යාංශය
2. සියලුම පළාත් ඉඩම් කොමසාරිස්වරුන්
3. ප්‍රධාන කාර්යාලයේ සියලුම මාණ්ඩලික නිලධාරීන්
4. ඉඩම් අංශයේ සියලුම නිලධාරීන්
5. ලේඛණ භාරකරු